**ගැටුම්වල බලපෑමට ලක් වූ ප්‍රදේශවල හදිසි අවශ්‍යතා ව්‍යාපෘතියේ (සීඒආර්ර්) – “ ඒ ”සංරචකය 2014**

**----------------------------------------------------------------------------------------------------------------**

ගැටුම්වල බලපෑමට ලක් වූ ප්‍රදේශවල හදිසි අවශ්‍යතා ව්‍යාපෘතියේ (සීඒආර්ර්) - “ ඒ ”සංරචකය 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2010 ජුනි 07 දින එළඹි අංක 2626 - එස්ආර්අයි දරන ණය ගිවිසුමේ උපලේඛන 2 හි II ආ වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**------------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, වර්තමානයේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර උතුරු පළාත් සභාව, උතුරු මැද පළාත් සභාව සහ මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ගැටුම්වල බලපෑමට ලක් වූ ප්‍රදේශවල, ජීවනෝපායයන්, ආර්ථික යටිතල පහසුකම් හා පරිපාලන සහ නෛතික සේවා ප්‍රතිස්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ “ ඒ ” සංරචකයේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 8,992.42 කට සමාන එජඩො මිලියන 69.59 ක් වූ අතර ඉන් රු.මිලියන 8,005.18 කට සමාන එජඩො මිලියන 61.95 ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 ජුනි 07 දින ආරම්භ කරන ලද අතර, 2013 ජුනි 30 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘතියේ කටයුතු නිමකිරීමේ දිනය 2014 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්,

ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව.

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------------

2007 අගෝස්තු 07 දිනැති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/2 දරන චක්‍රලේඛයට අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 ට පෙර විගණනයට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර 2016 ජනවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන චක්‍රලේඛයේ උපදෙස්වලට පටහැනිව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වාදෙන ලද සූත්‍රයක් පදනම් කරගෙන ව්‍යාපෘතියට අනුයුක්ත කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයන්ට සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු. මිලියන 11.17 ක පාරිශ්‍රමික ගෙවා තිබුණි.

(ආ) ව්‍යාපෘතියට අනුයුක්ත කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයන් 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන චක්‍රලේඛයේ 5.4 ඡේදය ප්‍රකාරව වෙනත් දීමනා

සඳහා හිමිකම් ලබා නොතිබුණද, වෛද්‍ය දීමනා ප්‍රතිපූර්ණය කිරීම් ලෙස ව්‍යාපෘතිය විසින් රු.240,685 ක මුදලක් ගෙවා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය තුළ හා 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීම සඳහා එකඟ වූ මුදල | | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2014 වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආසබැ | 61.95 | 8,005.18 | 14.26 | 1,842.73 | 61.37 | 7,930.06 |
| ශ්‍රීලංර | 7.64 | 987.24 | 1.45 | 186.76 | 6.63 | 856.37 |
| | 69.59 | 8,992.42 | 15.71 | 2,029.49 | 68.00 | 8,786.43 |

### 3.2 භෞතික ප්‍රගතිය

උතුරු පළාතේ හා උතුරු මැද පළාතේ මාර්ග කිලෝ මීටර් 265 ක් ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළ කොන්ත්‍රාත් පැකේජ 39 ක් යටතේ පුනරුත්ථාපනය කිරීමට අපේක්ෂා කර තිබූ බව නිරීක්ෂණය විය. ඉන්, කොන්ත්‍රාත් පැකේජ 37 ක් යටතේ පළාත් මාර්ග පුනරුත්ථාපන වැඩ 2014 දෙසැම්බර් 31 දිනට නිම කර තිබුණි. තවද, කොන්ත්‍රාත් පැකේජ 27 ක් යටතේ පුනරුත්ථාපන වැඩ මාස 01 සිට මාස 16 ක ප්‍රමාදයන් සහිතව නිම කර තිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පරිචයක් වශයෙන්, වැඩ විෂය පථයන් පිළිබඳ වෙනස් කිරීම් අදාළ පළාත් පාලන ආයතනවල නිලධාරීන් විසින් හෝ ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් අනුමත කර තිබුණි.

එබැවින් උතුරු මැද පළාතේ මාර්ග පැකේජ 04 ක් යටතේ මාර්ග පුනරුත්ථාපන වැඩවල ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 13 කින් ඉක්ම වූ විචලනයන් හා උතුරු පළාතේ මාර්ග පැකේජ 33 ක් යටතේ පුනරුත්ථාපන වැඩවල ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 828 කින් ඉක්ම වූ වෙනත් විචලනයන් බලයලත් පාර්ශවයන් විසින් අනුමත කර නොතිබුණි.

(ආ) තවද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.14.1 ඡේදයට පටහැනිව, උතුරු පළාතේ පළාත් මාර්ග 05 ක පුනරුත්ථාපන වැඩ සඳහා මුලින් නිමකිරීමට එකඟ වූ කාල පරිච්ඡේදය ඉක්මවා කිසිදු වලංගු හේතුවක් නොමැතිව දින 243 සිට දින 445 දක්වා කාලය දීර්ඝ කිරීම් ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් අනුමත කර තිබුණි.

(ඇ) මාර්ග පුනරුත්ථාපන වැඩ නිම කර දින 07 ක් ඇතුළත භාර දිය යුතු බවට නියම කර තිබූ කොන්ත්‍රාත් කොන්දේසිවල 10 වගන්තියට පටහැනිව, ව්‍යාපෘතිය විසින් පුනරුත්ථාපනය කරන ලද මාර්ග 2 ක් උතුරු පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දින 200 ක ප්‍රමාදයන් සහිතව භාර ගෙන තිබුණි.

(ඈ) 2016 මාර්තු 16 සිට 28 දක්වා විගණකවරුන් විසින් කරන ලද ස්ථානීය පරීක්ෂණවලදී මාර්ග පුනරුත්ථාපන වැඩවල තත්ත්ව අසාර්ථකවීම් හේතුවෙන් මාන්කුලම - වෙලන්කුලම් මාර්ගය, අක්කරායන්කුලම් - වන්නෙරිකුලම් මාර්ගය හා කොකාවිල් - තුනුක්කායි මාර්ගයේ ස්ථාන කිහිපයක මාර්ග මතුපිට පිපිරීම් නිරීක්ෂණය කරන ලදී. තවද මාර්ග ගමන් ආරක්ෂාව තහවුරු කිරීම සඳහා තුනුක්කායි සිට තෙනියන් මාර්ගයේ දෙපස මාර්ග සංඥා පුවරු (chevron boards) සවි කර නොතිබුණි.

### 3.4 මතභේදයට තුඩුදෙන කරුණු

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උපදේශක සේවා ගිවිසුම අනුව උපදේශකවරුන් විසින් කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් ක්‍රියාකරන ලද මුල් ලියකියවිලි කොන්ත්‍රාත්තුව සම්පූර්ණ වීමෙන් පසුව ව්‍යාපෘතියට භාර දිය යුතුය. කෙසේ වුවද ව්‍යාපෘතිය නිමකිරීමට අදාළ හුවමාරු ලිපිගොනු හා මුල් ලියකියවිලි, ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලීම් කීපයක් කර තිබුණද උපදේශකවරුන් විසින් භාර දී නොතිබුණි.

(ආ) වවුනියා හා කිලිනොච්චි පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ නිලනිවාස සඳහා වූ ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම් වැඩ මාර්ග පුනරුත්ථාපන වැඩ විෂය පථයට ඇතුළත් කර නොතිබුණද ව්‍යාපෘතිය විසින් එම වැඩ රු.මිලියන 4.2 ක පිරිවැයකට අලුත්වැඩියා කර තිබුණි.

(ඇ) එකතු කළ අගය මත බදු ලියාපදිංචිය අවලංගු වී පැවති කොන්ත්‍රාත්කරුවන් 4 දෙනෙකු සඳහා ව්‍යාපෘතිය විසින් රු.මිලියන 17.78 ක් වූ එකතු කළ අගය මත බදු ගෙවා තිබූ බව විගණනයේදී අනාවරණය විය.

## 4. ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීම

2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ කටයුතු අවසන් කර තිබුණද, භෞතික සමීක්ෂණ සිදු කිරීමෙන් පසුව හා 2014 දෙසැම්බර් 31 දිනට වසා දැමීමේ ගිණුම් හා ව්‍යාපෘති නිම කිරීම් වාර්තා පිළියෙල කිරීමෙන් පසුව ඉන්වෙන්ට්‍රි විෂයයන් අදාළ නියෝජිතායතනයන්ට භාරදීමට ව්‍යාපෘතිය හා ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය කටයුතු කර නොතිබුණි.